NALANDA VIDYALAYA

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

| 7 ශ්‍රේණිය | භූගෝල විද්‍යාව | ඒකකය: 2 - ශ්‍රී ලංකාවේ අනන්‍යතාවය |
|---|---|---|

## I කොටස

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

අංක 01 සිට අංක 10 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01) සමකයත් මකර නිවර්තනයත් අතර පිහිටි රටකි,

1) ඉන්දියාව 2) කැනඩාව 3) බ්‍රසීලය 4) ප්‍රංශය

02) පෘථිවි ආදර්ශ ගෝලයේ උතුරු අක්ෂාංශ 23.5$^{0}$ රේඛාව,

1) සමකය වේ. 2) කර්කටක නිවර්තනය වේ.

3) ආක්ටික් වෘත්තය 4) මකර නිවර්තනය වේ.

03) ශ්‍රී ලංකාවේ මුලු භූමියේ වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර,

1) 65610 කි 2) 56610 කි 3) 510 කි 4) 45560 කි

04) පෘථිවි ආදර්ශ ගෝලයේ දේශාංශ 00 හඳුන්වන්නේ,

1) ජාත්‍යන්තර දින රේඛාව ලෙසය 2) මධ්‍ය දේශාංශය ලෙසය

3) සමකය ලෙසය 4) චෙන්නාය වේලාව ලෙසය

05) ශ්‍රී ලංකාව පිහිටා ඇත්තේ,

1) උතුරු අක්ෂාංශය $5^{0}$.55’ . 9.51’ හා නැගෙනහිර දේශාංශ $79^{0}.41^{0}$ - $81^{0}$.53 අතරය

2) උතුරු අක්ෂාංශය $9^{0}$.51’ . 10.00’ හා නැගෙනහිර දේශාංශ $81^{0}.53^{0}$ - $83^{0}$.43 අතරය

3) දකුණු අක්ෂාංශය $80^{0}$.51’ . 82.53’ හා බටහිර දේශාංශ $79^{0}.41^{0}$ - $81^{0}$.53 අතරය

4) උතුරු අක්ෂාංශය $79^{0}$.41’ . 81.53’ හා නැගෙනහිර දේශාංශ $5^{0}.55^{0}$ - $9^{0}$.51 අතරය

06) ශ්‍රී ලංකාවේ භූ විෂමතා කලාපයක් වන වෙරළබඩ තැනිතලාව අයත් වන්නේ උස ප්‍රදේශය ය.

1) 0 m සිට $30^{0}$m දක්වා උස ප්‍රදේශය ය.

2) $30^{0}$ m සිට $300^{0}$m දක්වා උස ප්‍රදේශය ය.

3) 300 m පයින් උස ප්‍රදේශයය.

4) 3 m සිට $300^{0}$m දක්වා උස ප්‍රදේශය ය.

07) අභ්‍යන්තර තැනිතලාවේ පිහිටි කඳුවැටියක් වන්නේ,

1) පිදුරුතලාගල 2) සමණල

3) රිටිගල 4) නමුණුකුල

08) ඉන්දියන් සාගරයේ පිහිටි දූපතක් නොවන්නේ,

1) මාලදිවයින 2) කියුබාව

3) අන්දමන් දූපත් 4) සුමාත්‍රා

09) දකුණු ආසියාතික රටක් වන්නේ,

1) පාකිස්ථානය 2) ජපානය

3) චීනය 4) ඕස්ට්‍රේලියාව

10) වර්ෂය මුලුල්ලේම ක්‍රියාත්මක වන වර්ෂාවකි,

1) වාසුළි වර්ෂාව 2) සංවහන වර්ෂාව

3) මෝසම් වර්ෂාව 4) සුළිසුළං

**අංක 11 සිට 15 දක්වා දී ඇති වගන්තිය කියවාන හරි නම් ( ✔ ) ලකුණ ද වැරදි නම් (X) ලකුණද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

11) ශ්‍රී ලංකාව බහු සංස්කෘතික රටකි. (  )

12) සීගිරිය ස්වභාවික නිර්මාණයකි. (  )

13) ඉස්ලාම් භක්තියන් දීපවාලි උත්සවය සමරති. (  )

14) මධ්‍යම කඳුකරයේ උසින් අඩු ශාක දක්නට ඇත. (  )

15) පකිස්ථානය සමාජීය සංවර්ධනය තුළින් ඉහළ මට්ටමකට ළඟා වී ඇත. (  )

**අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තිත් ඉරි මත ලියා දක්වන්න.**

16) ශ්‍රී ලංකාව .............................. කලාපයට අයත් රටකි.

17) ශ්‍රී ලංකාවේ උසම කඳුවැටිය පිහිටා ඇත්තේ .............................. දිස්ත්‍රික්කයේය.

18) .............................. කුරුලු අභය භූමිය ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ පිහිටා ඇත.

19) ශ්‍රී ලංකාව පිහිටා ඇත්තේ .............................. අර්ධගෝලයේ ය.

20) .............................. දකුණු ආසියාවේ ඉහළතම සාක්ෂරතාවය ඇති රටකි.

## II කොටස

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01) පහත වගුවේ පෙන්වා ඇත්තේ ශ්‍රී ලංකාවේ ජාතික උරුමයයි. එම වගුව සම්පූර්ණ කරන්න.




02) 1) ඉන්දියන් සාගරයේ පිහිටි දූපත් දෙකක් නම් කරන්න. (ශ්‍රී ලංකාව හැර)

.................................................................................................................................................

2) කෙටියෙන් හඳුන්වන්න.

a) ශ්‍රී ලංකාවේ සාපේක්ෂ පිහිටීම

.................................................................................................................................................

.................................................................................................................................................

b) ශ්‍රී ලංකාවේ නිරපේක්ෂ පිහිටීම

.................................................................................................................................................

.................................................................................................................................................

3) a) ශ්‍රී ලංකාවේ ආදිවාසීන් ජීවත් වන ප්‍රදේශ දෙකක් නම් කරන්න.

.................................................................................................................................................

b) ආදිවාසීන් ප්‍රධාන ජීවනෝපායන් දෙකක් නම් කරන්න.

.................................................................................................................................................

.................................................................................................................................................

c) වර්තමානයේ ආදිවාසීන් නූතන ජන සමාජයට අනුවර්තනය වී ඇත. මෙය පැහැදිලි කරන්න.

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

03) 1) a) දේශගුණය හඳුන්වන්න.

.....................................................................................................................................................

b) ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප 3 ක් ලියා දක්වන්න.

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

2) පහත සඳහන් ලක්ෂණ සහිතව වැසි ලැබෙන ක්‍රම හා මාස ලියා දක්වන්න.

a) ගිගුරුම් සහිත වර්ෂාව ........................................... මාස ..............................

b) තද සුළං සහිත වර්ෂාව ........................................... මාස ..............................

3) a) දකුණු ආසියාතික රටවල් දෙකක් නම් කරන්න.

.....................................................................................................................................................

b) සමාජ සංවර්ධනය මනින් මිනුම් දඬු හතරක් ලියන්න.

.................................................................... ....................................................................

.................................................................... ....................................................................

c) ශ්‍රී ලංකාවේ සාක්ෂරතාවය ඉහළ මට්ටමක පැවතීමට බලපෑ හේතු තුනක් ලියා විස්තර කරන්න.

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................